සැ. යු.- 2014.11.14 දින පළ වූ අංක 1,889 දරන ගැසට් පත්‍රයේ I : III, III සහ IV (අ) කොටස් පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,890 - 2014 නොවැම්බර් මස 21 වැනි සිකුරාදා - 2014.11.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | 1808 |
| බුද්ධල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 දෙසැම්බර් මස 12 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 නොවැම්බර් මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම්

**ගම්පහ දිසා අධිකරණයේ දී ය.**

අංකය : 40958/මුදල්

ඇස්කිසි අංකය : 51/2012

රාගම, බටුවත්තේ අංක 243 දරන ස්ථානයේ පදිංචි පත්තම්පෙරුම ආරච්චිගේ දොන් වැන්සන් ජෝශප්.

නව ලිපිනය : අංක 930, මහබාගේ පාර, රාගම.

.....................................................පැමිණිලිකරු.

*එදිරිව*

1. කිරිබත්ගොඩ, විටෝ මාවතේ, අංක 218/1 දරන ස්ථානයේ පදිංචි අධිකාරිගේ චන්ද්‍රිකා පෙරේරා.

2. කිරිබත්ගොඩ, විටෝමාවතේ, අංක 218 දරන ස්ථානයේ පදිංචි අධිකාරිගේ චන්ද්‍රරත්න පෙරේරා.

නව ලිපිනය : 3එම්/26, දෙවෙනි පටුමග, ජාතික නිවාස සංකීර්ණය, කිරිබත්ගොඩ.

3. උඹරාපොල, අත්තනගල්ල පාර, අංක 95 දරන ස්ථානයේ පදිංචි නිමල් ප්‍රේමසිරි වනිගසුන්දර

නව ලිපිනය : රද්දොළුගම, නිවාස එන්. එච්. එස්. අංක 3බී/44/ආර් හි පදිංචි නිමල් ප්‍රේමසිරි වනිගසුන්දර

.....................................................විත්තිකරුවන්.

මෙම නඩුවේ වාර්තාගතකර ඇති වර්ෂ 2007 ක් වූ අප්‍රේල් මස 30 දිනැති තීන්දු ප්‍රකාශය පරිදි 02 වැනි සහ 03 වැනි විත්තිකරුවන් විසින් එක් වී සහ වෙන් වෙන්ව පැමිණිලිකරුට ගෙවිය යුතු, මුදල් ලියවිලි සහ භාණ්ඩවල වටිනාකම වශයෙන් රුපියල් ලක්ෂ තුන රු. 3,00,000ක මුදල ද, අලාභ වශයෙන් ගෙවිය යුතු රුපියල් ලක්ෂ පහ රු. 5,00,000ක මුදල ද, එකතුව රුපියල් ලක්ෂ අට රු. 8,00,000ක මුදල සහ නඩු ගාස්තු ද අයකර ගැනීම සඳහා තහනමට ගන්නා ලද ඉහත නම සඳහන් 02 වන විත්තිකරුට අයිති මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ වර්ෂ 2014 ක් වූ, දෙසැම්බර් මස 18 වැනි දින ප. ව. 2.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ සියනෑ කෝරළයේ අදිකාරි පත්තුවේ දලුගම සුළු නගර සභා සීමාව තුළ දලවතුහේන්පිට උතුරේ පිහිටි කෝන්ගහවත්ත නැමැති ඉඩමේ එක්ස් දරන කැබැල්ලට කේ. ඒ. රූපසිංහ බලයලත් මිනින්දෝරු තැනගේ අංක 1021 සහ වර්ෂ 2006.09.14 දිනැති සැලැස්ම පරිදි මායිම්, උතුරට : කීර්ති සමරසිංහට අයිති ඉඩම ද, නැගෙනහිරට : උපුල් ලියනවඩුගේ යන අයගේ ඉඩම ද, දකුණට : විටෝ මාවත ද, බස්නාහිරට : අංක 25 ඒ දරන කැබැල්ල ද, යන මෙකී මායිම් තුළ පර්චස් විසිදෙකයි දශම දෙකයි පහ (අ. 0, රූ. 0, පර්. 22.25)ක් හෙවත් හෙක්ටයාර් 0.0563 ක් විශාලා ඉඩම සහ එහි පිහිටි ගස කොළ පළතුරු ගොඩනැගිලි ඇතුළු සියලු දේ ද වේ.

මෙම ඉඩම කොළඹ ඉඩම් කාර්යාලයේ සී 694/231 හි ලියාපදිංචි වී ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - ගම්පහ.

2014 නොවැම්බර් මස 03 වැනි දින දී ය.

11-559

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.